支援者や関係者の方向け

日本語

外国につながる子ども・若者と家族向けパンフレット

# こんなとき、どうすればいいですか？

～小学生から高校生と家族の皆さんへ～



国立障害者リハビリテーションセンター
発達障害情報・支援センター

Sinhara
シンハラ語

විදේශීය මූලයන් ඇති ළමුන් සහ තරුණ වැඩිහිටියන් සහ
ඔවුන්ගේ පවුල් සඳහා ලබා දෙන පොත් පිංච

# කුමක් ක්‍රියාවක් කළ යුතු දැයි ඔබ නොදන්නා විටක

~ප්‍රාථමික පාසලේ සිට උසස් විද්‍යාල දක්වා වයස් සීමාවේ සිටින දරුවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා~



ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික පුනරුත්ථාපන මධ්‍යස්ථානය
විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා තොරතුරු සහ සහාය මධ්‍යස්ථානය

# はじめに

　近年、日本で生まれ育つ、外国につながる子ども・若者が増えています。

　ことばや生活習慣の違う国での生活や子育てに困っていたり、ことばの問題で必要な情報が得られず困っている人もみえるかもしれません。

　その中には、発達障害について知りたいと思っている人、子どもさんや自分が発達障害ではないかと心配している人も、みえることでしょう。

　今回、そのような方々に、発達障害の種類や特徴、さまざまな支援（教育、医療、福祉、労働など）について理解を深めていただくためにパンフレットをつくりました。

　このパンフレットが、皆さんのお役に立てることを願っています。

国立障害者リハビリテーションセンター
発達障害情報・支援センター

＜パンフレットについて＞

　次のような方々に読んでもらうことを想定しています。

- 日本語版（この冊子）
  対象：外国につながる発達障害児者（小学生～高校生）にかかわる支援者、関係者。
- やさしいにほんご版（ふりがなあり・ふりがななし）
  対象：外国につながる子どもや若い人（小学生～高校生）の、本人、家族など。

※もっと小さい子どもを育てている家族のためのパンフレット（姉妹版）もあります。

- 「お子さんの発達について心配なことはありますか？
  ～日本で子育てをする保護者の方へ～」
  対象：外国につながる発達障害児（就学前）の家族、支援者や関係者。
  （25の言語に対応しています）




［注釈］このパンフレットでは、対象としている読み手の読みやすさを大切にするため、「子ども」と表記します。

# හැඳින්වීම

ජපානයේ උපත ලද හා එහිම හැදී වැඩුන විදේශීය මූලයන් ඇති දරුවන් සහ තරුණ වැඩිහිටියන් සංඛ්‍යාව වැඩි වෙමින් ඇති බව පෙන්නුම් කරයි.

එකී පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට වෙනස් භාෂාවක් සහ ජීවන ශෛලියක් ඇති රටක ජීවත් වීමට හෝ දෙමාපියන් වීමට වෙහෙසක් දැරීමට සිදුවිය හැකිය. භාෂා බාධක නිසා ඔවුන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට ද ඔවුන් වෙහෙසක් දරනු ඇත.

සමහර පවුල් විකාශණ ආබාධ ගැන අවබෝධ කර ගැනීමට කැමැත්තක් දක්වන අතර, තවත් සමහරු තමන්ට හෝ තම දරුවාට එවැනි තත්වයක් තිබිය හැකි යැයි සැලකිලිමත් වීමද සිදු කරයි.

මෙම පොත් පිංච මගින් විකාශණ ආබාධවල වාර්ගිකත්වය සහ ලාක්ෂණිකත්වය මෙන්ම අධ්‍යාපනය, වෛද්‍ය විද්‍යාව, සමාජ සුභසාධනය සහ රැකියා ක්ෂේත්‍රය ඇතුළු ජපානයේ අන්තර්ගත විවිධ ආධාරක සම්පත් දායකත්වය පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා දීම අරමුණු වේ.

ජපානයේ, විකාශණ ආබාධ සහිත පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහාය වීම සඳහා කැපවූ සංවිධාන රාශියක් ඇත. ඔබට යම් ආකාරයක ගැටළුවක් ඇතිනම් සහය ලබා ගැනීමට පසුබට නොවන්න.

මෙම පොත් පිංච ඔබට සහ ඔබේ පවුලේ අයට ප්‍රයෝජනවත් මූලයක් වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා තොරතුරු සහ සහාය මධ්‍යස්ථානය
ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික පුනරුත්ථාපන මධ්‍යස්ථානය

සටහන: මෙම පොත් පිංච ප්‍රධාන වශයෙන් ප්‍රාථමික පාසලේ සිට උසස් විද්‍යාල දක්වා ළමුන් සහ ඔවුන්ගේ පවුල් සඳහා නිර්මාණය කර ඇත.
පාසල් යන වයසට වඩා අඩු දරුවන් සිටින පවුල් සඳහා, අප සතුව වෙනස් පොත් පිංචක් තිබේ.

ඔබේ දරුවාගේ වර්ධනය ගැන ඔබ සැලකිලිමත් වී තිබේද?
~ජපානයේ දරුවන් ඇති දැඩි කරන දෙමාපියන් සඳහා~




පාසල් වයසට පෙර දරුවන් සිටින විදේශීය දෙමාපියන් සඳහා පොත් පිංච

# 目次

1. 発達障害によくある特徴的な行動 ... 3
小学生 ... 3
中学生・高校生 ... 4
2. 発達障害について知りたい ... 5
発達障害とは ... 5
外国につながる子どものことばと発達障害 ... 6
＜参考＞はじめにおぼえた言葉（母語）が上手になると、日本語も上手になります ... 7
3. 相談をしたい ... 8
誰に相談したら、いいですか？ ... 8
発達障害のことを相談したい ... 8
学校生活についての相談 ... 9
＜参考＞特別な支援が必要なお子さんの教育（特別支援教育）の場 ... 11
子どもための、そのほかの相談 ... 12
仕事についての相談 ... 13
住んでいるところの相談場所 ... 14
4. 病院に行きたい ... 15
病院について ... 15
検査、個別療法 ... 15
発達障害と診断されたら ... 16
快適に過ごすための薬の利用 ... 16
5. 支援や制度について ... 17
発達障害者支援法について ... 17
障害者差別解消法について ... 17
障害者手帳について ... 18
6. まわりの人ができること ... 20
7. 情報を集めたい ... 21
発達障害に関する情報 ... 21
学校教育に関する情報 ... 22
暮らしに役立つ情報 ... 22
外国語での相談サービスなど ... 23
翻訳アプリ ... 23
英日用語集 ... 24

# පටුන

**1. විකාශණ ආබාධවල ලාක්ෂණික හැසිරීම් ........................................................ 3**
ප්‍රාථමික පාසල් වයස ........................................................ 3
කනිෂ්ඨ උසස් සහ උසස් විද්‍යාල වයස ........................................................ 4
**2. විකාශණ ආබාධ පිළිබඳව අධ්‍යයනය ........................................................ 5**
විකාශණ ආබාධ යනු කුමක්ද? ........................................................ 5
විදේශීය මූලයන් සහ විකාශණ ආබාධ සහිත දරුවන්ගේ භාෂා සංවර්ධනය ........................................................ 5
ඉඟි: පළමු (ස්වදේශීය) භාෂාව සංවර්ධනය කිරීම ජපන් භාෂාව සංවර්ධනය කිරීමට උපකාරී වේ ........................................................ 6
**3. උපදේශන විශේෂඥයින් ........................................................ 8**
උපදේශන සංවිධාන සොයා දැන ගැනීම ........................................................ 8
විකාශණ ආබාධ පිළිබඳ උපදේශනය ........................................................ 8
පාසල් ජීවිතය පිළිබඳ උපදේශනය ........................................................ 9
ඉඟි: විශේෂ අවශ්‍යතා අධ්‍යාපන මාර්ගෝපදේශ සිතියම ........................................................ 11
අනෙකුත් උපදේශන සංවිධාන ........................................................ 12
කාර්ය පිළිබඳ උපදේශනය ........................................................ 13
ප්‍රජා සම්පත් ........................................................ 14
**4. වෛද්‍යවරයෙකු මුණ ගැසීම ........................................................ 15**
රෝහල් ........................................................ 15
ඇගයුම් සහ පුද්ගල ප්‍රතිකාර ........................................................ 15
ඔබේ දරුවාට විකාශණ ආබාධයක් ඇති බවට රෝග විනිශ්චයක් ඇති විටක ........................................................ 16
ඖෂධවල ප්‍රතිලාභ ........................................................ 16
**5. සහාය සහ පද්ධති පිළිබඳව අධ්‍යයනය ........................................................ 17**
විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහාය පිළිබඳ නියාමන පනත ........................................................ 17
ආබාධ සහිත පුද්ගලයින්ට අසාධාරන ලෙස වෙනස් කම් කොට සැලකීම් කිරීම තුරන් කිරීමේ නියාමන පනත ........................................................ 17
ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහතික ........................................................ 18
**6. දරුවා වෙනුවෙන් කිරීමට හැකි දේ කුමක්ද? ........................................................ 20**
**7. තොරතුරු එක් රැස් කිරීම ........................................................ 21**
විකාශණ ආබාධ පිළිබඳ තොරතුරු ........................................................ 21
පාසල් අධ්‍යාපනය පිළිබඳ තොරතුරු ........................................................ 22
දෛනික ජීවිතය සඳහා තොරතුරු ........................................................ 22
විදේශීය භාෂාවලින් උපදේශනය ........................................................ 23
පරිවර්තන යෙදුම ........................................................ 23

# 1. 発達障害によくある特徴的な行動

発達障害には特徴的な行動があります。

下に示した例は、発達障害でよくある特徴的な行動です。これらの行動が、どこでも、長期間みられると、発達障害の可能性があります。

## 小学生

- ✓ 授業中に、いすを揺らす、お喋りが多い、集中して勉強に取り組むことが難しい。
- ✓ 授業中に、立ち歩く、教室の外に出ていく。
- ✓ 順番を守れず割り込む、ほかの子どもが使っているものを急に取るなど。
- ✓ 感情のコントロールが難しく、パニックになることがある。
- ✓ 宿題や持ち物をよく忘れる。
- ✓ 準備や片付けに、とても時間がかかる。

- ✓ 特定の音にとても敏感で、学習や生活が困難になる。
- ✓ 味やにおいに敏感、偏食がとても多い。
- ✓ 遊び、規則、服、作業の進め方などへのこだわりが強く、変えることが難しい。
- ✓ 話を一方的に始めて、勝手にやめてしまう。
- ✓ ルールや約束を、気にしない。
- ✓ 友達と一緒に活動することが苦手で、ひとりでいることが多い。

- ✓ 先生の話をきく、指示を理解することが難しい。
- ✓ 日本語でも母語でも、字を読むこと、文章を読んで理解することが難しい。
- ✓ 文字を書くこと、文章を書くことが難しい。
- ✓ 簡単な足し算や引き算ができない。
- ✓ 黒板の字を見て覚えながら、手を動かしてノートに書くことが難しい。
- ✓ 手先が不器用で、工作などが苦手。
- ✓ 言葉の始めの音を繰り返す、のばす、とめる。
- ✓ 家族とはよく話すが、外に出るとまったく話せない。

# 1. විකාශණ ආබාධවල ලාක්ෂණික හැසිරීම්

විකාශණ ආබාධ ඇති අය බොහෝ විට ආවේනික වූ හැසිරීම් පෙන්නුම් කරනු ලබයි.

විකාශණ ආබාධවලට ආවේණික වූ හැසිරීම් සඳහා උදාහරණ පහත දැක්වේ. යම් පුද්ගලයෙකු දීර්ඝ කාලයක් පුරා විවිධ තත්වයන් යටතේ ඒවා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරන්නේ නම්, ඔවුන්ට විකාශණ ආබාධයක් තිබිය හැකිය.

## ප්‍රාථමික පාසල් වයස

- ✓ පන්තියේ සිටින අතරතුර, පුටුව පැද්දවීම, උවමනාවට වඩා කථාබස් කිරීම, එසේත් නැතිනම් අවධාරනය කිරීමට නොපෙළඹවීම
- ✓ පන්තියේ සිටින අතරතුර, පන්ති කාමරය වටා ඇවිදීම හෝ එයින් බැහැර වීම
- ✓ අනුපිළිවෙලට මාරු වීම නොකිරීම, අන් අයට බාධා කිරීම්, වෙනත් ළමයින් භාවිතා කරන දේ හදිසියේම උදුරා ගැනීම
- ✓ හැඟීම් පාලනය කිරීමට අපහසු වන අතර ඇතැම් විටක ව්‍යාකූලත්වයට පත්වීම
- ✓ බොහෝ විටක ගෙදර වැඩ සහ අත්‍යවශ්‍ය තම බඩු බාහිරාදිය අමතක වීම
- ✓ දෙයක් එකලස් කිරීමට හෝ පිරිසිදු කිරීමට බොහෝ වේලාවක් ගත කිරීම

- ✓ අධ්‍යයනයට හෝ දෛනික ජීවින කටයුතු වලට බාධා කරන, විශේෂිත ශබ්ධ වලට ඉතාමත් සංවේදී වීම
- ✓ රස හෝ සුවඳ වලට සංවේදී වීම, නැතහොත් ආහාර සම්බන්ධයෙන් බොහෝ විට තෝරා බේරා ගැනීම
- ✓ විශේෂිත ක්‍රියාකාරකම්, නියාමනයන්, ඇඳුම් පැළඳුම් හෝ චර්යාවන් සඳහා දැඩි කැමැත්තක් ඇතිවීම්, සහ ඇති කරනු ලබන වෙනස්වීම් වලට වෙහෙසක් දැරීම
- ✓ ඒකපාර්ශ්වික සංවාදවල යෙදීම හා හදිසියේම ඒවා නතර කිරීම
- ✓ නියාමනයන් හෝ පොරොන්දු ගැන සැලකිල්ලක් නොදැක්වීම
- ✓ මිතුරන් සමඟ සිදු කරනු ලබන කාණ්ඩ ක්‍රියාකාරකම් වලට එතරම් යුහුසුළු බවක් නොදැක්වීම හා නිතරම තනිවම කාලය ගත කිරීමට කැමැත්තක් දැක්වීම

- ✓ ගුරුවරයාට සවන් දී උපදෙස් අනුගමනය කිරීම අභියෝගයට ලක් කිරීම
- ✓ ජපන් භාෂාවෙන් සහ තම මව් භාෂාවෙන් ලිඛිත වචන හෝ වාක්‍ය හඳුනා ගැනීමට හෝ තේරුම් ගැනීමට අපහසු වීම
- ✓ අක්ෂර හෝ වාක්‍ය ලිවීමේ අපහසුතාවයක් තිබීම
- ✓ සරල ගණිත එකතු කිරීමක් හෝ අඩු කිරීමක් කළ නොහැකි බව
- ✓ කළු ලෑල්ලෙන් සටහන් පිටපත් කිරීමේ අපහසුතාවයක් තිබේ නම්
- ✓ අත් හැසිර වීම අවුල් සහගත බව හා, අත්කම් වලට එතරම් යුහුසුළු බවක් නොදැක්වීම
- ✓ වචනයක පළමු ශබ්දය නැවත නැවත උච්ඡාරණය කිරීම, දිගු ගැස්වීම හෝ අතර මග නැවතීම
- ✓ පවුලේ අය සමඟ නිදහසේ කතා බස් කිරීම, නමුත් නිවසින් බාහිර සිටින විට නිහඬව සිටීම

# 中学生・高校生

- ✓ ノートや筆記用具、教科書をよくなくす。
- ✓ 毎月のお小遣いを、すぐに使いきってしまう。
- ✓ 整理整頓が苦手、忘れ物が多い。
- ✓ 感情の上がり下がりが激しい、怒るとひどい言葉や乱暴な行動がある。
- ✓ 気が散りやすく、集中して学習に取り組むことが難しい。
- ✓ 気を付けていても、不注意な間違いがよくある。

- ✓ 自分だけが、一方的に長々と話しつづける。
- ✓ 集団行動が難しい、一人でいることが多い。
- ✓ 場の雰囲気を感じ取ることや、暗黙のルールの理解が難しい。
- ✓ こだわりがあり、活動の切り替えが難しい。
- ✓ 服の色や、生地などへのこだわりがある。
- ✓ 特定の音にとても敏感で、学習や生活に支障がある。
- ✓ 急な予定の変更が、受け入れられない。



- ✓ 先生の話を理解すること、指示を理解することが難しい。
- ✓ 数学だけが、とても遅れている。
- ✓ 文字の読み書き（日本語、母語）だけが、とても遅れている。
- ✓ 黒板の字を見て覚えながら、手を動かしてノートに書くことが難しい。
- ✓ 言葉のはじめの音を繰り返す、のばす、とめる。
- ✓ 家族とはよく話すが、外に出るとまったく話せない。



家庭と学校では、行動がちがうこともあります。

学校での様子については、担任や関わりのある先生達からよく確認してください。

# කනිෂ්ඨ උසස් සහ උසස් විද්‍යාල වයස

- ✓ සටහන් පොත්, පෙළපොත් හෝ ලිපි ද්‍රව්‍ය නිතර නිතර අස්ථාන ගත වීම
- ✓ දරුවන්ට මාසිකව ලබා දෙන වියදම් දීමනාව ඉතා ඉක්මණින් වියදම් කර අවසන් කිරීම
- ✓ සංවිධානාත්මක කටයුතු ඉටුකිරීමට යුහුසුළු භාවය, සහ බොහෝ විට අත්‍යවශ්‍ය බඩු බාහිරාදිය අමතක කිරීම
- ✓ දැඩි චිත්තවේගීය මනෝභාවයන් වෙනස් වීම, රළු භාෂාව භාවිතා කිරීම හෝ කෝපයට පත් වූ විට ප්‍රචණ්ඩකාරීත්වයට පත් වීම
- ✓ පහසුවෙන් අවධානය වෙනතකට යොමු වන අතර අධ්‍යයනය කෙරෙහි අවධානය යොමු කිරීමට දැඩි ප්‍රතිරෝධයක් දැක්වීම
- ✓ අවධානය යොමු කිරීමකදී පවා නොසැලකිලිමත් අතපසු කිරීම් සිදු කරයි



- ✓ මාරුවීමක් සිදු නොකර අඛණ්ඩව කතා කිරීම
- ✓ කාණ්ඩ ක්‍රියාකාරකම් සමඟ ගැටීම් ඇති කරන අතර නිතරම තනිවම කාලය ගත කිරීමට කැමැත්තක් දැක්වීම
- ✓ සමාජ හෝඩුවාවන් හෝ සමාජ නියාමනයන් තේරුම් ගැනීමට අපහසු වීම
- ✓ යම් යම් කාර්යයන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන අතර ඒවා මාරු කිරීමට අපහසුකම
- ✓ ඇඳුම්වල වර්ණ හා රෙදිපිළි නිෂ්පාදන අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් විශේෂත්ව සැලකීමක් තිබීම
- ✓ අධ්‍යයනයට හෝ දෛනික ජීවන කටයුතු වලට බාධා කරන, විශේෂිත ශබ්ධ වලට ඉතාමත් සංවේදී වීම
- ✓ සැලසුම් වල හදිසියේ වෙනස් කිරීම් පිළිගැනීමේ අකමැත්ත

- ✓ උපදෙස් හෝ ගුරුවරයා පවසන දේ තේරුම් ගැනීමට ඇති අපහසුකම
- ✓ ගණිත විෂය කෙරෙහි පමණක් ඇති දැඩි පසුගාමිත්වය
- ✓ කියවීමේ සහ ලිවීමේ පමණක් ඇති දැඩි පසුගාමිත්වය (ජපන් සහ තම ස්වදේශීය භාෂාවෙන්)
- ✓ කළු ලෑල්ලෙහි දක්වන සටහන් පිටපත් කිරීමේ අපහසුතාවය
- ✓ වචනයක පළමු ශබ්දය නැවත නැවත උච්ඡාරණය කිරීම, දිගු ගැස්වීම හෝ අතර මග නැවතීම
- ✓ පවුලේ අය සමඟ නිදහසේ කතා බස් කිරීම, නමුත් නිවසින් බාහිර සිටින විටක නිහඬව සිටීම




දරුවා නිවසේදී සහ පාසලේදී විවිධ හැසිරීම් ප්‍රදර්ශණය කරනු ලබයි. එවැනි විටක, පාසලේදී ඔවුන්ගේ හැසිරීම් සම්බන්ධයෙන් ගුරුවරයාගෙන් විමසන්න.

# 2. 発達障害について知りたい

## 発達障害とは

“発達障害”は、一般の子どもとは少し脳の働き方が異なる、多くは生まれつきのユニークな性質（特性）です。発達障害には下の図のように、いくつかのタイプがあります。

同じ障害でも特徴のあらわれかたには、個人差があります。2つ以上の発達障害がある人もいます。

・ 3～4ページでは、よくある特徴的な行動をあげましたが、発達障害がある人は色々な強みを持つ場合もあります（例：目で見てとらえることが得意、情報や機械的な記憶が得意、新しいことに関心をもつ、活発、感覚が鋭いなど）。

**発達障害者支援法における発達障害の定義**（第２条）…

発達障害とは、発達障害（自閉症、アスペルガー症候群その他の広汎性発達障害、学習障害、注意欠陥多動性障害などの脳機能の障害で、通常低年齢で発現する障害）がある者であって、発達障害および社会的障壁により日常生活または社会生活に制限を受けるもの（ICD-10疾病及び関連保健問題の国際統計分類におけるF80-98に含まれる障害）

**＜発達障害の主な種類＞**

＊がある言葉はDSM-5-TRでの発達障害の名前です

知的な遅れがあることもあります

### 自閉スペクトラム症：ASD ＊

- 人と会話したり、気持ちを伝えあったりするのがむずかしいです。
- 相手の気持ちを考えたり、場面に合わせて行動するのがむずかしいです。
- いつも同じ行動をしたり、好きなことばかりします。
- 光や色、音、匂い、味などについて、ほかの人よりも強く感じて不快に思うことがあります。反対に、わかりにくいことがあります。
- 言葉の発達が遅れることもあります。

診断を受けた時期などによって、アスペルガー症候群、自閉症、広汎性発達障害（PDD）と診断されている人もいます。

### 注意欠如多動症：ADHD ＊

- 長いあいだ、同じことをするのがむずかしいです。
- たくさん動いたり、話したりします。
- 考える前に動くことが多いです。

### 限局性学習症：SLD ＊

- 特に「読むこと」や「書くこと」、「算数（数学）」に困っていたり、むずかしいことがあります。学習障害（LD）と呼ぶこともあります。

■ トゥレット症＊や、児童期発症流暢症＊（吃音）、発達性協調運動症＊も、発達障害の1つです。

# 2. විකාශණ ආබාධ පිළිබඳව අධ්‍යනය

## විකාශණ ආබාධ යනු කුමක්ද?

විකාශණ ආබාධ යනු සාමාන්‍යයෙන් මොළයේ ක්‍රියාකාරිත්වයේ සුළු සහජ වෙනස්කම් වන අතර එමඟින් ඔවුන් සාමාන්‍යයෙන් වර්ධනය වන දරුවන්ගෙන් වෙන්කර හඳුනාගැනීමේ හැකියාව පහත රූපයේ දැක්වෙන පරිදි, එකම ආබාධය එක් එක් පුද්ගලයා තුළ වෙනස් ලෙස ප්‍රකාශ විය හැකි. සමහරුන්ට විකාශණ ආබාධ වර්ග දෙකක් හෝ වැඩි ගණනක් තිබේ.
මෙයට අමතර ආවේනික වූ හැසිරීම් එනම් වසර,3 සිට 4 දක්වා පිටුවල දක්වා ඇති පරිදි, ඔවුන් හට විවිධ ශක්තීන් පෙන් වීමේ හැකියාව තිබෙන අතර, (උදා: මනා දෘශ්‍ය සංජානනයක් තිබීම, වඩා හොඳ ස්මරණයක් හෝ යාන්ත්‍රික මතකයක් තිබීම, නවතම දේවල් ඉගෙන ගැනීමේ අභිප්‍රාය, ජවසම්පන්න භාවය, හෝ තියුණු ඉන්ද්‍රිය හැඟීම් තිබීම).

**සංවර්ධන ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහාය පනත යටතේ වර්ධන ආබාධ පිළිබඳ අර්ථ දැක්වීම (2 වන වගන්තිය):**
විකාශණ ආබාධ අතරට මොළයේ ක්‍රියාකාරිත්වයේ ඌනතාවයන් ඇතුළත් වේ, එනම් ඔටිසම්, ඇස්පර්ජර් සින්ඩ්‍රෝමය සහ අනෙකුත් ව්‍යාප්ත විකාශණ ආබාධ, අධ්‍යන ආබාධ සහ අවධානය අඩු කිරීමේ අධි ක්‍රියාකාරිත්වයේ ආබාධ, සාමාන්‍යයෙන් මුල් ළමාවියේදී දක්නට ලැබේ. විකාශණ ආබාධ ඇති පුද්ගලයින් යනු ඔවුන්ගේ ආබාධ සහ සමාජ බාධක හේතුවෙන් ඔවුන්ගේ දෛනික හෝ සමාජීය ජීවිතයේ සීමාවන් අත්විඳින අයයි. (වෙනත් වචන වලින් කිවහොත්,විකාශණ ආබාධ යනු ජාත්‍යන්තර රෝග සහ ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු වර්ගීකරණය, 10 වන සංශෝධනය හෝ ICD-10 හි F80 සිට 98 දක්වා අංකනය කර ඇති ඒවා වේ.)

### විකාශණ ආබාධවල ප්‍රධාන වර්ග

බුද්ධිමය සංවර්ධන ප්‍රමාදයන් සහ සම්බන්ධයක් තිබීම

මානසික ආබාධ පිළිබඳ රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය අත්පොත, පස්වන සංස්කරණය, පෙළ සංශෝධනය (DSM-5-TR) හි විකාශණ ආබාධවල නම් තරු ලකුණු (*) මගින් දැක්වේ.

#### ඔටිසම් වර්ණාවලී ආබාධය; ASD*

- සංවාද සමඟ හෝ ඔවුන්ගේ හැඟීම් ප්‍රකාශ කිරීමේදී ගැටුමක් ඇති කිරීමේ හැකියාව
- අන් අයගේ හැඟීම් තේරුම් ගැනීමට හෝ ඔවුන්ගේ හැසිරීම තත්වයට අනුව සකස් කර ගැනීමට අභියෝග කිරීම
- එකම ක්‍රියාවන් නැවත නැවතත් කිරීමට හෝ තමන්ගේ සිත්ගන්නා දේ කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමේ හැකියාව
- ආලෝකය, වර්ණ, ශබ්ද හෝ/ගන්ධ වලට අධි සංවේදීතාවයක් තිබීම
- භාෂා සංවර්ධනයේ ප්‍රමාදයන් ඇතිවීම

රෝග විනිශ්චය කරන අතරතුර, සමහර පුද්ගලයින්ට ඇස්පර්ජර් සින්ඩ්‍රෝමය, ඔටිසම් හෝ ව්‍යාප්ත විකාශණ ආබාධ (PDDs) ඇති බව හඳුනා ගැනීම.

#### අවධානය අව වීමේ අධි ක්‍රියාකාරීත්ව ආබාධය; ADHD*

- දිගු වේලාවක් සමාන දෙයක් කිරීමේ අපහසුතාවය
- බොහෝ විට එහා මෙහාට චලනය වීම හෝ උවමනාවට වඩා කථාබස් කිරීම
- බොහෝ විට යමක් සිතීමට පෙර ආවේගශීලීව ක්‍රියා කිරීම

#### විශේෂිත අධ්‍යන ආබාධ; SLD*

- කියවීම, ලිවීම හෝ/ගණිතය සම්බන්ධයෙන් විශේෂිත දුෂ්කරතාවයන් ඇති වීම

SLD යන්න සමහර විටක අධ්‍යන ආබාධ (LD) ලෙසද හැඳින්වේ

■ අනෙකුත් විකාශණ ආබාධ අතරට ටියුරෙට් සින්ඩ්‍රෝමය*, ළමා කාලයේ සිට කතා කිරීමේ හැකියාව අඩු වීමේ ආබාධය* (ගොතගැසීම) සහ වර්ධන සම්බන්ධීකරණ ආබාධය* ඇතුළත් වේ.

# 【参考】外国につながる子どもの言葉と発達障害

お父さんとお母さん（両親）がともに外国人、お父さんかお母さんの一方が外国人である子どもを、日本では外国につながる子ども（または、外国にルーツをもつ子ども）と呼んでいます。

外国につながる子どもと家族は、2つの国の言葉（言語）で生活をしていることが多く、このような人を2言語話者（バイリンガル）と呼んでいます（中には、3つ以上の言葉の中で暮らしている人もいます）。

外国につながる子どもの言葉の発達について、ご家族や支援者から、よく次のような悩みを聞きます。「言葉の遅れが、発達の障害によるものか、不自由な日本語環境で暮らすことによるものか、判断が難しい」。

バイリンガルの子どもの言葉の発達は、どのような特徴があるのでしょうか。そして、どんなときに、障害を疑わなければいけないのでしょうか。

## ● 子どもの言葉の発達

すべての言葉において、幼いときの言葉の発達は同じです。

- 1歳前からジェスチャーを使うようになります（バイバイ、指差しなど）。
- それに続いて、言葉が出はじめます（「パパ」、「ママ」など）。
- 1歳6か月から2歳の間に、50から100の言葉を覚えます。
  そして、2つの言葉をつなぎ、2語文を話せるようになります（「おそと、いく」など）。

バイリンガルで1つの言葉だけが遅れている場合は、心配はありません。
幼いときの言葉の発達が、2つの言葉とも遅れている場合は、言語発達の遅れを疑う必要があります。

## ● バイリンガルの言葉の発達には4つの特徴があります。

- 2つの言葉が使い分けできない2歳から3歳児は、2つの言葉を混ぜて使います。
  これは、バイリンガルの子どもとしては普通のことです。
- 環境によって使う言葉が異なるために、知っている言葉の数（語彙数）にかたよりがでます。日本語の語彙数だけを調べると、少ないという結果が出ることがあります。
  語彙数を調べる場合は、2つの言葉を調べ、足した数がその子の語彙数になります。
  足した語彙数が日本人の数と同じか、それ以上であれば、遅れはありません。
- 4歳になると、2つの言葉が異なったものであることが、はっきりと分かります。そして、人、場所、話の内容などによって、使い分けるようになります。例えば、同じ国から最近やってきた子どもには1つ目の言葉（母語）で、日本人の友達には日本語で返事をします。これは、状況に合わせて、2つの言葉を使い分ける高い言語力を示す行動です。

# විදේශීය මූලයන් සහ විකාශණ ආබාධ සහිත දරුවන්ගේ භාෂා සංවර්ධනය

දරුවන්, ජපානයේ එක් විදේශීය දෙමාපියෙකු (මව හෝ පියා) හෝ විදේශීය දෙමව්පියන් සිටින, එසේත් නැතිනම්, විදේශීය මූලයන් ඇති, (හෝ විදේශීය පසුබිමක් ඇති දරුවන්) ලෙස හැඳින්වේ.
විදේශීය මූලයන් ඇති මෙම දරුවන් සහ ඔවුන්ගේ පවුල් බොහෝ විට තම දෛනික ජීවිතයේදී භාෂා දෙකක් භාවිතා කරන අතර, එබැවින් එය ද්විභාෂා ලෙස හැඳින්වේ. (සමහර පුද්ගලයන් ද්විත්ව භාෂාවකට වඩා භාවිතා කිරීම කරනු ලබයි.)
දරුවෙකුගේ භාෂා ප්‍රමාදය විකාශණ ආබාධ නිසාද, නැතහොත් දරුවාට සහ ඔවුන්ගේ පවුලට නුහුරු ජපන් භාෂාව කතා කරන පරිසරයක ජීවත් වීමේ ප්‍රතිඵලයක්ද යන්න තීරණය කිරීමේදී, විදේශීය මූලයන් ඇති දරුවන්ගේ පවුල් හෝ එම පවුල් ආධාරකරුවන් බොහෝ විට අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ.
ද්විභාෂා දරුවෙකු භාෂා කුසලතා වර්ධනය කරන්නේ කෙසේද සහ සංවර්ධන දුර්වලතා පෙන්නුම් කරන සංඥා මොනවාදැයි ගවේෂණය කරමු.

## ● ළමුන් තුළ භාෂා සංවර්ධනය

මුල් සංවර්ධන සියලු භාෂාවන්ට පොදු වේ.

- වයස අවුරුදු 1 ට පෙර අභිනයන් එනම් (උදා: බායි-බායි, ඇඟිල්ල දිගු කිරීම) භාවිතා කිරීමට පටන් ගනු ලබයි
- එයින් පසුව ක්‍රමයෙන් වචන භාවිතා කිරීම ආරම්භ කරනු ලැබේ (උදා: තාත්තා, අම්මා)
- මාස 18 සිට අවුරුදු 2 දක්වා කාලය තුළ වචන 50 සිට 100 දක්වා ඉගෙන ගනී

ඉන්පසු වචන දෙකක වාක්‍ය ඛණ්ඩ භාවිතා කිරීමට පටන් ගනී (උදා: අම්මේ යන්න).

ද්විභාෂා කතා කරන දරුවෙකුට, එක් භාෂාවක ප්‍රමාදය අනිවාර්යයෙන්ම කනස්සල්ලට හේතුවක් නොවේ.
භාෂා දෙකෙහිම ප්‍රමාදයක් භාෂා වර්ධන ප්‍රමාදයේ සලකුණක් විය හැකිය.

## ● ද්විභාෂා දරුවන්ගේ භාෂා වර්ධනයේ ගති ලක්ෂණ හතරක්

- අවුරුදු 2 සිට 3 දක්වා ළමුන්ට භාෂා දෙකක් වෙන වෙනම භාවිතා කර ඒවා මිශ්‍ර කළ නොහැක. ද්විභාෂා කතා කරන දරුවන්ට මෙය සාමාන්‍ය දෙයකි.
- ඔවුන් විවිධ පරිසරවල භාෂා දෙකක් භාවිතා කරන බැවින්, ඔවුන්ගේ වචන මාලාවේ ප්‍රමාණය දෙක අතර වෙනස් විය හැකිය. ඔවුන්ගේ ජපන් වචන මාලාව කුඩා විය හැකිය. භාෂා දෙකෙහිම ඔවුන් දන්නා වචන ඒකාබද්ධ කිරීමෙන් වචන මාලාවේ ප්‍රමාණය මනිනු ලැබේ. ජපන් දරුවෙකුගේ එකතුවට වඩා වැඩි හෝ සමාන එකතුවක් ප්‍රමාදයක් නොමැති බව පෙන්නුම් කරයි.
- වයස අවුරුදු 4 වන විට, දරුවන්ට භාෂා දෙක වෙන්කර හඳුනා ගැනීමටත්, කවුරුන් සමඟින්, කුමණ ස්ථානයකදී, කුමක් පිළිබඳව කතා කළ යුතුද යන්න මත පදනම්ව ඒවා වෙන වෙනම භාවිතා කිරීමටත් හැකි වේ. උදාහරණයක් ලෙස, ඔවුන් මෑතකදී ජපානයට පැමිණි එම විදේශීය මූලය ඇති දරුවෙකුට ඔවුන්ගේ මුල් (ස්වදේශීය) භාෂාවෙන් ප්‍රතිචාර දක්වන අතර, ඔවුන්ගේ ජපන් මිතුරන්ට ජපන් භාෂාවෙන් ප්‍රතිචාර දක්වයි. මෙයින් පෙන්නුම් කරන්නේ ස්ථානීය තත්වයන් අනුව භාෂා දෙකක් වෙන වෙනම භාවිතා කිරීම පෙන්වීමට ඇති ඔවුන්ගේ ඉහළ භාෂාමය හැකියාව වේ.
- මෑතකදී ජපානයට පැමිණි සමහර දරුවන් (විශේෂයෙන් අවුරුදු 4 සිට 8 දක්වා) මද කාලයක් (නිහඬ කාලයක්) කතා නොකර සිටිය හැක. මෙය සාමාන්‍යයෙන් මාස හයක් පමණ කාලයක් පවතී. ඉන්පසු ඔවුන් ක්‍රමයෙන් අභිනයන්, සරල සුබ පැතුම් (උදා: *ඔහයෝ*) සහ ඉල්ලීම් සඳහා ප්‍රකාශන (උදා: *කුදසායි*) භාවිතා කිරීමට පටන් ගනී.

・ 日本に来て間もない子ども（とくに4歳から8歳）は、しばらく言葉を話さないことがあります（沈黙期）。長さは6か月ほどです。それから、少しずつ、ジェスチャー、簡単なあいさつ、要求表現（「おはよう」、「ください」など）を言うようになります。
これを、場面緘黙症と間違えないようにしましょう。

## ● 新しい言葉を使えるようになるには、時間がかかります。

小学校に入る前後に日本にくる子もいます。言葉を使えるようになるまでの期間は、使う言葉の難しさの程度によって異なります。

・ 日本語では、生活に必要な言葉（基礎的会話能力）は、小学生で2，000語程度です。これは、2年程度で話せるようになるのが普通です。
・ 平仮名や短い文（単文）の読み書き（基礎的な学習言語能力）は、学習を始めて2年程度で身につくのが普通です。
・ 勉強に必要な難しい言葉や文章を話し、読み書きができるようになる（教科学習言語能力）には、早い子どもでも5年から7年かかります。

新しい言葉が使えるようになるのは、意外に時間がかかるものです。これらを、基準に子どもの言葉の力を評価してみましょう。

## <参考>はじめにおぼえた言葉（母語）が上手になると、日本語も上手になります

子どもが、2つの言葉を覚えるのは難しい、言葉の発達、知能の発達の遅れの原因にもなると信じられていた時代がありました。現在は、その考えは否定されています。

1つ目の言葉（母語）がよく話せる子は、2つ目の言葉（日本語）の上達も早いことが分かっています。母語がよく話せないと、日本語しか話せなくなる心配があります。こうなると、お父さんやお母さんとの話しや心の交流がうまくできなくなる心配があります。

自分が自然に話せる言葉を使って、子どもと会話をしましょう。たとえば、お父さんやお母さんは、いつも母語で、先生、日本人の友達はいつも日本語ではなしましょう（1人1言語の原則）。

### 障害のある子どもについても同じです。

障害のあるバイリンガルの子ども（自閉スペクトラム症、ダウン症候群など）についても、たくさんの研究がおこなわれてきました。その結果、発達に心配のない子ども（定型発達児）と同様なことが証明されています。安心して、1人1言語の原則で接し、バイリンガルとして育てましょう。

- **නව භාෂාවක් ඉගෙන ගැනීමට එක්තරා කාලය ගතවේ**

සමහර දරුවන් පාසල් වයසට පැමිණීමටත් පෙර ජපානයට ආගමනය වනු ලබයි. දරුවාට භාෂාව වඩාත් අභියෝගාත්මක වන විට නව භාෂාවක් ඉගෙනීමට වැඩි කාලයක් ගත වීම සිදුවේ.

- ප්‍රාථමික පාසල් සිසුවෙකුට දෛනික ජීවිතයට සහ මූලික සංවාදයට අත්‍යවශ්‍ය ජපන් වචන 2,000ක් පමණ ඉගෙන ගැනීමට අවශ්‍ය වන අතර, ඒ සඳහා සාමාන්‍යයෙන් වසර 2ක් පමණ ගත වේ.
- දරුවෙකු සාමාන්‍යයෙන් වසර 2ක ඉගෙනීමෙන් පසු *හිරගනා* කියවීමට සහ ලිවීමට සහ කෙටි, තනි වාක්‍ය (මූලික අධ්‍යයන භාෂා කුසලතා) ඉගෙන ගනු ලබයි.
- ඉක්මනින් පවා අධ්‍යයනය කිරීමට අවශ්‍ය වඩාත් දුෂ්කර වචන සහ වාක්‍ය (විෂයයන් ඉගෙනීම සඳහා අධ්‍යයන කුසලතා) කතා කිරීම, කියවීම සහ ලිවීම ප්‍රගුණ කිරීමට සාමාන්‍යයෙන් අවුරුදු 5 සිට 7 දක්වා කාලයක් ගතවේ.

අලුත් භාෂාවක් අධ්‍යයනය භාෂා කුසලතා ඉගෙන ගැනීමට බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගතවේ.
ඉහත තොරතුරු භාවිතා කර ඔබේ දරුවාගේ භාෂාමය කුසලතා තක්සේරු කරන්න.

## ඉඟි: පළමු (ස්වදේශීය) භාෂාව වර්ධනය කිරීම ජපන් භාෂාව සංවර්ධනය කිරීමට උපකාරී වේ.

භාෂා දෙකක් ඉගෙනීම දරුවෙකුට අපහසු බවත් එය ඔවුන්ගේ භාෂාව සහ බුද්ධිමය වර්ධනය ප්‍රමාද කළ හැකි බවත් කලක් විශ්වාස කෙරිණි. කෙසේ වෙතත්, මෙය දැන් වැරදි ලෙස සැලකේ.

පළමු (ස්වදේශීය) භාෂාව හොඳින් කතා කරන දරුවෙකු සාමාන්‍යයෙන් දෙවන භාෂාව (ජපන්) හොඳින් ඉගෙන ගන්නෙකු වේ. දරුවා තම මව් භාෂාව හොඳින් ඉගෙන නොගන්නේ නම්, ඔවුන්ට ජපන් භාෂාව පමණක් කතා කළ හැකි අතර ඔවුන්ගේ දෙමාපියන් සමඟ සන්නිවේදනය කිරීමට සහ අන්තර් ක්‍රියා කිරීමට අපහසු විය හැකිය.

ඔබට පහසු භාෂාවක් භාවිතා කරමින් ඔබේ දරුවා සමඟ සන්නිවේදනය කරන්න. උදාහරණයක් ලෙස, දෙමව්පියන් දරුවා සමඟ ඔවුන්ගේ මව් භාෂාවෙන් කතා කළ යුතු අතර, ජපන් ගුරුවරුන් සහ මිතුරන් සමගින් ජපන් භාෂාවෙන් කතා කළ යුතුය (එක් පුද්ගලයෙකු-එක් භාෂා මූලධර්මය).

### ආබාධ සහිත දරුවන්ට ද මෙය අදාළ වේ

ද්විභාෂා ආබාධ සහිත දරුවන් (උදා: ඔටිසම් වර්ණාවලී ආබාධය හෝ ඩවුන් සින්ඩ්‍රෝමය) පිළිබඳ පුළුල් පර්යේෂණවලින් සොයාගෙන ඇත්තේ ඔවුන්ගේ භාෂා සංවර්ධන මාවත වර්ධන ගැටළු නොමැති දරුවන්ට (සාමාන්‍යයෙන් වර්ධනය වන දරුවන්) සමාන බවයි. ඔබේ දරුවා ද්විභාෂා භාවිතා කරන්නෙකු ලෙස ඇති දැඩි කිරීම සඳහා සහතිකකර ඇති එක් පුද්ගලයෙකුට එක් භාෂා මූලධර්මය අනුගමනය කරන්න.

# 3.相談をしたい

発達障害のある人やそのご家族が安心して生活できるように、地域にはいろいろな支援機関があります。気になること、心配なことがあれば、早めに相談をしましょう。

・ 相談機関によって、通訳サービスが使える場合と使えない場合があります。事前に確認しましょう。通訳サービスが使えない場合は、翻訳アプリが使用できるように準備をするといいでしょう。

## 誰に相談したら、いいですか？

市区町村は、地域で生活する発達障害のある方やそのご家族からの相談に応じ、必要な情報提供を行っています。
年齢や相談内容によっても、相談する機関がちがいます。
まずは、お住まいの市区町村の役所に相談しましょう。



## 発達障害のことを相談したい

### ● 発達障害者支援センター

発達障害者支援センターは、発達障害のある子どもや大人を、支援しています。発達障害者支援センターは、日本全国にあります。発達障害がある人が相談することができます。また、発達障害かもしれないと思っている人やその家族も相談できます。相談を聞いて、困っていることを支援できるところを、紹介することもあります。

＜発達障害者支援センターはどこにありますか？＞
ウェブサイトで探すことができます。
https://www.rehab.go.jp/ddis/action/center/

# 3. උපදේශන විශේෂඥයින්

විකාශණ ආබාධ සහිත පුද්ගලයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට උපකාර කරන විවිධ ආධාරක සංවිධාන ඔබේ ප්‍රදේශයේ ඔබට සොයාගත හැකිය. ඔබට නිරාකරණය කර ගැනීමට කිසියම් ගැටළුවක් ඇත්නම්, ඉක්මනින් ඔවුන් අමතන්න.

- සමහර සංවිධාන පරිවර්තන සේවා සපයන අතර අනෙක් ඒවා එසේ නොකරනු ලබයි. කලින්ම සංවිධානය සම්බන්ධ කිරීම් අමතන්න. පරිවර්තන සේවාවක් නොමැති විට ඔබට පරිවර්තන යෙදුමක් සූදානම්ව තබා ගත හැකිය.

## උපදේශන සංවිධාන සොයා දැන ගැනීම

විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සහ ඔවුන්ගේ ප්‍රදේශයේ ජීවත් වන ඔවුන්ගේ පවුල්වල ඉල්ලීම පරිදි පළාත් පාලන ආයතන අදාළ තොරතුරු සපයයි. සුදුසු සංවිධාන වයස සහ උත්සුකතාවයන්ගේ ස්වභාවය අනුව වෙනස් වේ.

කරුණාකර පළමුව ඔබේ පළාත් පාලන කාර්යාලය සම්බන්ධ කිරීම් අමතන්න.



## විකාශණ ආබාධ පිළිබඳ උපදේශනය

### ● විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා උපකාරක මධ්‍යස්ථානය

විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ආධාරක මධ්‍යස්ථාන, විකාශණ ආබාධ සහිත දරුවන් සහ වැඩිහිටියන් මෙන්ම ඔවුන්ගේ පවුල් සඳහා සම්පත් දායකත්වය සපයනු ලබයි. සෑම ප්‍රාන්තයකම සහ ආඥාපනතෙන් නම් කරන ලද නගරයකම විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන මධ්‍යස්ථාන ඇත.

රෝග විනිශ්චය කර ඇති පුද්ගලයින්ට අමතරව, රෝග විනිශ්චයකින් තොරව විකාශණ ආබාධ ඇති අයට සහ ඔවුන්ගේ පවුල්වලට මධ්‍යස්ථානවලදී උපදෙස් ලබා ගත හැකිය.

උපදේශක ;විසින් වෙනත්, වඩාත් සුදුසු සහාය සංවිධානයකට යොමු කළ හැකි අතර, එම සංවිධානය සැලකිලිමත් වීමේ ස්වභාවය සහ පුද්ගලයාගේ තත්වය මත රඳා පවතී. රට පුරා පිහිටි මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු සඳහා කරුණාකර පහත වෙබ් අඩවිය බලන්න.

**<විකාශණ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ආධාරක මධ්‍යස්ථාන ලැයිස්තුව>**
https://www.rehab.go.jp/ddis/action/center/ (ජපන් භාෂාවෙන්)

# 学校生活についての相談

学校には、安心して学校生活を送れるように、相談にのってくれる人がたくさんいます。また、障害のある子どもや青年のための、さまざまな教育の場があります。

## ● 担任の先生

学校生活で、心配なことや困ったことがあったら、最初に担任の先生に相談しましょう。

## ● 保健室と養護教諭（保健室の先生）

学校には保健室があり、学校でけがをしたとき、こころやからだの具合がわるくなったときに利用します。保健室には、こころとからだの健康を担当する先生（養護教諭）がいます。こころやからだの悩みごとの相談にものってもらえます。

## ● 特別支援教育コーディネーター

特別支援教育コーディネーターは、学校における障害児教育（特別支援教育）のまとめ役です。お父さん、お母さんの相談にものってくれます。

## ● スクールカウンセラーやスクールソーシャルワーカー

学校には、こころの相談にのってくれる心理職（スクールカウンセラー）、福祉の相談にのってくれる福祉士（スクールソーシャルワーカー）などもいます。困っていることを一緒に考え、必要な情報を教えてくれます。相談は、予約制になっている場合もあります。くわしくは、担任の先生や特別支援教育コーディネーターなどに、きいてみましょう。



# පාසල් ජීවිතය පිළිබඳ උපදේශනය

සහනශීලි පාසල් ජීවිතයක් ගත කිරීම පිණිස සිසුන්ට සහාය වන කාර්ය මණ්ඩල සාමාජිකයින් පාසල් තුල සිටිති. ආබාධ සහිත ළමුන් සහ තරුණ වැඩිහිටියන් සඳහා විවිධ පන්ති සහ පාසල් අධ්‍යාපන පද්ධතිය තුල ඇතුළත් වේ.

- **පන්ති භාර ගුරුවරයා**
  පාසල් ජීවිතය පිළිබඳව කිසියම් ගැටළුවක් ඇති වූ විට, පළමුව පන්ති භාර ගුරුවරයා හමුවී උපදෙස් ලබා ගන්න.

- **පාසල් හෙද කාර්යාලය සහ පාසල් හෙදිය**
  සෑම පාසලකම තුවාල ලබන හෝ ශාරීරිකව හෝ චිත්තවේගීයව ආපදාවන්ට ලක්වන වන සිසුන් රැකබලා ගැනීම සඳහා හෙද කාර්යාලයක් ඇත. පාසල් හෙදියන් මානසික හා ශාරීරික සෞඛ්‍යය පිළිබඳ විශේෂඥතාවක් ඇති අතර මෙම ගැටළු සඳහා උපදේශන ලබා දිය හැකිය.

- **විශේෂ අවශ්‍යතා අධ්‍යාපන සම්බන්ධීකාරක**
  විශේෂ අවශ්‍යතා සහිත අධ්‍යාපන සම්බන්ධීකාරක වරුන්වන්ගේ වගකීම නම් අධ්‍යාපනික සහාය සංවිධානය කිරීම සහ පිළියෙල කිරීම හා ආබාධ සහිත දරුවන්ට පාසල තුළ සුදුසු නවාතැන් පහසුකම් ලබා දීම සහතික කිරීම වේ. ඔවුන්ට දෙමාපියන් සඳහා උපදේශන ලබා දිය හැකිය.

- **පාසල් උපදේශක සහ පාසල් සමාජ සේවක**
  පාසල්වල මානසික සෞඛ්‍ය උපදේශන සපයන මනෝවිද්‍යාඥයින් (පාසල් උපදේශකයින්) සහ සමාජ සුභසාධන කටයුතු සඳහා උපකාර කළ හැකි සමාජ සේවකයින් (පාසල් සමාජ සේවකයින්) සිටිති. ඔවුන් ඔබේ ගැටළු වලට සවන් දීමට මෙන්ම මඟ පෙන්වීම කරනු ලබයි. උපදේශනය සඳහා හමුවීම් වේලාවක් වෙන් කර ගැනීමේ ක්‍රියාවලිය අවශ්‍ය විය හැකිය, එබැවින් වැඩිදුර තොරතුරු සඳහා පන්ති ගුරුවරයාගෙන් හෝ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන සම්බන්ධීකාරකගෙන් විමසන්න.



## ー 進路の相談 ー

中学校卒業後の進路としては、高等学校への進学を選択することが多いでしょう。高等学校には、全日制普通科、職業科（商業、工業、農業など）、定時制普通科（昼間の定時制もあります）、多様なコースのある総合高等学校、必要な授業を選んで受けられる単位制高等学校などもあります。

また、通信制高等学校のように自宅学習が中心の高等学校、特別支援学校高等部などの選択肢もあります。本人の特性や希望に応じて、進路先を選ぶ必要があります。

事前に、進路を希望する学校を見学する、説明会に参加するなどして、学校の様子を調べておくことが大切です。中学校在学中に、担任や特別支援教育コーディネーターの先生と相談することが必要です。

## ー 高等学校に向けた準備について ー

発達障害のある生徒で、中学校在籍時から定期試験で特別な配慮を受けてきた場合などの場合、高等学校の入学試験を受けるときに、事前に申請して合理的配慮（17ページを参照）を受けることができます。公立学校を受けるときは自治体の教育委員会へ、私立学校を受けるときは直接その学校へ問い合わせてください。

なお、社会で自立していくためには、高等学校で適切な教育を受けることが重要であることから、公立高等学校の入学試験（入学者選抜）については、外国人生徒を対象とした特別定員枠をつくること、受検のときの合理的配慮（試験教科の軽減、問題文の漢字はふり仮名を打つなど）などの取組が進められています。 ※詳しくは通っている学校の先生にきいてください。

※「高等学校入学者選抜等における配慮等について」（令和6年6月25日　6文科初第779号）

## ー 高等学校を卒業したあと ー

高等学校卒業後の進路としては、大学や専門学校への進学、就職などが考えられます。本人の希望や特性に応じて、考えることが大切です。進学する場合は、卒業後の進学や就職についても、考えておくことが必要です。

## – වෘත්තීය උපදේශනය –

බොහෝ දරුවන් කනිෂ්ඨ උසස් පාසල සමත් වීමෙන් පසු උසස් පාසල් අධ්‍යාපනය අඛණ්ඩව සිදු කරනු ලබයි. ජපන් උසස් පාසල් සාමාන්‍යයෙන් පූර්ණ කාලීන සාමාන්‍ය පාඨමාලා, වෘත්තීය පාඨමාලා (උදා: වාණිජ, ඉංජිනේරු හෝ කෘෂිකර්ම පාඨමාලා) සහ/හෝ අර්ධ කාලීන සාමාන්‍ය පාඨමාලා (දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ) මෙහෙය වීම සිදු කරනු ලබයි. අනෙකුත් උසස් පාසල් අතර විවිධ පාඨමාලා සහිත පුළුල් උසස් පාසල් සහ තෝරාගත් විෂයමාලා පැවරුම මත පදනම් වූ (සෑම විෂයයකින්ම සමත්වී සමාප්තිය ලබා ගැනීම සඳහා අවශ්‍ය වූ පැවරුම් ලකුණු ප්‍රමාණය) උසස් පාසල් ඇතුළත් වේ.

අනෙකුත් පාසල් විකල්ප අතරට නිවසේ සිට පාසල් අධ්‍යාපනය කේන්ද්‍ර කරගත් දුරස්ථ ඉගෙනුමට සහ විශේෂ අවශ්‍යතා සහිත අධ්‍යාපන පාසල්වල උසස් පාසල් පාඨමාලා ඇතුළත් වේ. පාසල් අධ්‍යාපනය පිළිබඳ විකල්ප තීරණය දරුවාගේ අභිලාෂයව සහ චරිත ලාක්ෂණිකත්වය මත පිළිබිඹු කළ යුතුය.

තීරණයක් ගැනීමට පෙර විවිධ පාසල් පිළිබඳ තොරතුරු රැස් කිරීමේ කාර්ය වැදගත් වේ. විභව පාසල් වෙත පිවිසීම හෝ පාසල් තොරතුරු සම්මන්ත්‍රණ වලට පැමිණ සම්බන්ධ වන්න. දරුවා දැනට කනිෂ්ඨ උසස් පාසලේ අධ්‍යාපනය ලබන අතරතුරදීම, පන්ති භාර ගුරුවරයා සහ විශේෂ අවශ්‍යතා සහිත අධ්‍යාපන සම්බන්ධීකාරකවරයා හමු වී උපදේශණ ලබා ගන්න.

## – උසස් පාසල සඳහා සූදානම් වීම –

කනිෂ්ඨ උසස් පාසලේ නිතිපතා පවත්වන විභාග සඳහා නවාතැන් පහසුකම් ලබා ඇති විකාශණ ආබාධ සහිත සිසුන්, උසස් පාසල් ප්‍රවේශ විභාග සඳහා කල්තියා අයදුම් කරන්නේ නම්, සුදුසු නවාතැන් පහසුකම් (17 පිටුව බලන්න) ලබා දීමේ හැකියාව ඇත. රජයේ පාසල් විභාග සඳහා දිස්ත්‍රික් අධ්‍යාපන මණ්ඩලය හා සම්බන්ධ වී ඇමතීම මෙන්ම, පෞද්ගලික පාසල් විභාග සඳහා පාසල සෘජුවම අමතන්න.

අනාගත සමාජ ස්වාධීනත්වය නිර්මාණය කිරීමේදී උසස් පාසල් අධ්‍යාපනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. රජයේ පාසල් පිණිස වන ප්‍රවේශ විභාග (ශිෂ්‍ය තේරීම්) විදේශීය සිසුන් සඳහා විශේෂ ඇතුළත් වීමේ කෝටා සහ සාධාරණ නවාතැන් (උදා: විභාග විෂයයන් අඩු කිරීම, හෝ පරීක්ෂණවලදී කන්ජි සඳහා ෆුරි ගනා වැනි කියවීමේ ආධාරක) ඇතුළු විවිධ සලකා බැලීම් ඉදිරිපත් කරයි*. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඔබේ දරුවාගේ පාසල් ගුරුවරයා සම්බන්ධ කිරීම් අමතන්න.

**Koto-gakko nyugakusha-senbatsuto ni okeru hairyoto ni tsuite* (උසස් පාසල් සිසුන් ඇතුලත් වීමී තෝරා ගැනීමේදී නවාතැන් සහ අනෙකුත් සලකා බැලීම්) 2024 ජූනි 25 (දැනුම්දීම අංක 779, 2024, ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපන කාර්යාංශය, MEXT).

## – සමත් වීමෙන් පසු උසස් පාසල වෙතින් –

සමත් වීමෙන් පසු උසස් පාසලෙන්, සිසුන්ට විශ්ව විද්‍යාලයට හෝ වෘත්තීය පාසලට යාමට හෝ ශ්‍රම බලකායට ඇතුළත් වීමට හැකිය. දරුවාගේ අභිලාෂයන්ට සහ ආවේනික චරිතය අනුව තීරණය කළ යුතුය. උසස් අධ්‍යාපනය හැදෑරීම ඉලක්කය නම්, සමත් වීමෙන් පසු, වැඩිදුර අධ්‍යාපනය හෝ රැකියාවක් ගැන කල්තියා කල්පනා කිරීමද වැදගත් වේ.

## ● 参考 ： 支援が受けられる特別支援教育の場（下図を参照）

　図のように、障害に適した様々な教育が受けられる学級、学校があります。子どもや先生とよく話し合い、自分の子どもに適した学級、学校を決めましょう。

# ＜参考＞特別な支援が受けられる教育（特別支援教育）の場

## 小学校・中学校

### 通常の学級

集団生活の中で、特別な支援が必要なお子さんに対する配慮や工夫をしています。

#### 通級による指導（通級指導教室）

ほとんどの授業を通常の学級で受けて、決まった時間（月または週に数回）だけ別の教室に通います。
お子さんの学習や生活の課題について、個別の支援を受けることができます。

### 特別支援学級

少人数の学級です。
対象のお子さんの障害によって、知的障害、肢体不自由、病弱・身体虚弱、弱視、難聴、言語障害、自閉症・情緒障害の7種類の学級があります。
学校によって、設置されている学級の種類や数がちがいます。

＊「通級指導教室」や「特別支援学級」が設置されていない学校もあります。

## 特別支援学校

視覚障害、聴覚障害、肢体不自由、病弱、知的障害のあるお子さんのための学校です。

知的障害のある自閉スペクトラム症のお子さんは、知的障害のある特別支援学校の対象になります。

少人数の学級で、障害に応じた専門的な教育を行っています。

高等部では、卒業後の社会生活、職業生活に向けた活動もあります。

## 中学校卒業後（高等学校など）

高等学校に入学すると、授業や定期テストでは、学校と相談をしながら配慮や支援を受けることができます。また、通級による指導（通級指導教室）を受けることができる学校もあります。

## 大学・専門学校など

学校の中に、障害のある学生を支援したり、学校生活のことを相談できる場所※があります。
授業や試験を受ける時に必要な支援や、学校生活で困っていることを相談することができます。
※学内の保健センターや学生相談室、障害学生支援室など

## ඉඟි: විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය (පහත බලන්න)

පහත රූපයේ දැක්වෙන පරිදි, විවිධ පන්ති සහ පාසල් විවිධ ආබාධ සහිත දරුවන් සඳහා සකස් කර ඇති අධ්‍යාපනය ලබා දෙයි. තම දරුවාගේ අවශ්‍යතාවලට වඩාත් ගැලපෙන පන්තිය හෝ පාසල තෝරා ගැනීමට ඔබේ දරුවා සහ ගුරුවරයා සමඟ සැළකිල්ලෙන් සාකච්ඡා කරන්න.

# ඉඟි: විශේෂ අවශ්‍යතා අධ්‍යාපන මාර්ගෝපදේශ සිතියම

## ප්‍රාථමික සහ කනිෂ්ඨ උසස් පාසල්

### නිතිපතා පන්ති

විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට කණ්ඩායම්, ප්‍රධාන ධාරාවේ සැකසුමක නවාතැන් සහ සහාය ලැබේ.

### බැහැරට කැඳවීම් උපදෙස් (සම්පත් කාමර වැඩසටහන)

සිසුන් බොහෝ දුරට නිතිපතා පන්ති වලට පැමිණෙන අතර අධ්‍යනයේ සහ දෛනික ජීවිතයේ අභියෝගවලට මුහුණ දීම සඳහා, පුද්ගලිකව සිදු කරන ලබන සහායන් පිණිස සතියකට හෝ මසකට කිහිප වතාවක් වෙනම කාමරයකට කැඳවීම් කරනු ලබයි.

### විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා විශේෂ පන්ති

විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින විශේෂ පන්ති, පන්ති වශයෙන් ගත් කල ප්‍රමාණයෙන් කුඩා වන අතර, ආබාධිත වර්ග පදනම මත වර්ග හතකට වර්ගීකරණය කර ඇත: බුද්ධිමය ආබාධ, ශාරීරික ආබාධ, සෞඛ්‍ය දුර්වලතා, අඩු පෙනීම, ශ්‍රවණාබාධ, කථන සහ භාෂා ආබාධ, ඔටිසම් සහ චිත්තවේගීතා ආබාධ/දුෂ්කරතා.
පාසල් අතර පන්ති වර්ග සහ සංඛ්‍යාවේ වෙනස් වේ.

සටහන: සම්පත් කාමර වැඩසටහන් හෝ විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සමඟ සිදු කරනු ලබන විශේෂ පන්ති සෑම පාසලකම නොමැත.

## කනිෂ්ඨ උසස් පාසලෙන් පසු (උසස් පාසල් සහ අනෙකුත් මාර්ග)

උසස් පාසල් තමා සහ තම දරුවා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව පන්ති සහ නිතිපතා විභාග පරීක්ෂණ සඳහා නවාතැන් සහ සහාය ලබා දෙයි.
සමහර පාසල් විශේෂ උපදෙස් සඳහා සම්පත් කාමර ලබා දෙයි.

## විශේෂ අවශ්‍යතා සහිත අධ්‍යාපන පාසල්

මේවා දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත, ශාරීරික ආබාධ, සෞඛ්‍ය ආබාධ හෝ බුද්ධිමය ආබාධ සහිත දරුවන් සඳහා වන පාසල් වේ.
බුද්ධිමය ආබාධ සඳහා වන පාසල්, ඔටිසම් වර්ණාවලී ආබාධ සහිත සහ සහසම්බන්ධ බුද්ධිමය ආබාධ ඇති දරුවන් ද නවාතැන් ගනී.
මෙම පාසල් පන්ති ප්‍රමාණයෙන් කුඩා වන අතර, එක් එක් ආබාධිතයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති විෂයමාලා සපයනු ලැබේ.
සමත් වීමෙන් පසුව, ඔවුන්ගේ උසස් පාසල් වල පාඨමාලා මඟින් පසු සමාජීය හා වෘත්තීය ජීවිතය සඳහා සිසුන් සූදානම් කරන ක්‍රියාකාරකම් සපයනු ලබයි.

## විශ්ව විද්‍යාල, වෘත්තීය පාසල් සහ වෙනත් මාර්ග

මෙම පාසල් ආබාධ සහිත සිසුන්ට සහාය වීමට සහ ඔවුන්ගේ පාසල් ජීවිතය සම්බන්ධයෙන් උපදේශන ලබා දීමේ සේවා සපයයි.
සිසුන්ට පන්ති සහ විභාග සඳහා නවාතැන් පහසුකම් මෙන්ම ඔවුන්ගේ පාසල් ජීවිතය පිළිබඳ ඕනෑම ගැටළුවක් පිළිබඳව උපදෙස් ලබා ගත හැකිය.
*උදාහරණ ලෙස විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළම සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන, ශිෂ්‍ය උපදේශන කාමර සහ ආබාධ සහිත සිසුන් සඳහා වන උපකාරක මධ්‍යස්ථාන ඇතුළත් වේ.

# 子どものための、その他の相談

## 教育相談機関

教育相談機関では、教育についての相談をおこないます。相談する機関としては、都道府県の特別支援教育センターや教育センター、市区町村の教育相談室などがあります。相談は無料です。

## 児童家庭支援センター

市区町村の役所には、子どもと家庭の相談をおこなう係（児童家庭支援センター）があります。子どもに関するさまざまな問題について、家庭や市民などからの相談に応じています。相談は無料です。

## 児童相談所

児童相談所では、市区町村と協働、連携、役割分担をして、児童（18歳未満）や保護者からの相談をおこなっています。障害相談（身体の障害、ことばの遅れや吃音、知的障害、自閉スペクトラム症、限局性学習症などに関する相談）や、子育て相談（落ち着きがない、臆病、家庭であばれる、学校に行かない、規則的な生活ができない、家出をするなど生活習慣や行動についての相談）などもおこなっています。相談は無料です。

## 法務少年支援センター

法務少年支援センターでは、子ども（年齢に制限はありません）、家族、学校の先生、子どもの支援者などからの心理相談に応じています。主な相談内容は、非行、親子関係、職場や学校などでの問題、友だち関係などです。子どもに限らず、成人の相談もおこなっています。相談内容の秘密は守られます。相談は無料です。各都道府県庁所在地など、全国に52か所にあります。全国共通相談ダイヤル（0570-085-085）から、近くの法務少年支援センターにつながります。

## 相談窓口情報（こども家庭庁）

子どもが抱えるさまざまな困難について、子ども自身が悩みを相談でき、SOS（助けてほしいこと）に対応してくれる係、子育て当事者の皆さんが、悩みを相談できる係の情報がのっています。相談は無料です。

https://www.cfa.go.jp/children-inquiries

# අනෙකුත් උපදේශන සංවිධාන

## ● අධ්‍යාපනික උපදේශන සංවිධාන

මෙම සංවිධාන අධ්‍යාපනික ගැටළු පිළිබඳව උපදේශන සපයනු ලබයි. උදාහරණ ලෙස ගතහොත්, ප්‍රාන්තීය විශේෂ අවශ්‍යතා සහිත අධ්‍යාපන මධ්‍යස්ථාන සහ පළාත් පාලන ආයතනවල අධ්‍යාපන උපදේශන කාමර ඇතුළත් වේ. උපදේශනය නොමිලේ සිදු වේ.

## ● ළමා සහ පවුල් සහාය මධ්‍යස්ථාන

සෑම පළාත් පාලන කාර්යාලයකම වෙනම අංශයක් (ළමා සහ පවුල් ආධාර මධ්‍යස්ථානයක්) ඇති අතර, එහිදී පවුල්, පදිංචිකරුවන්ට මෙන්ම ළමයින්ට අදාළ ගැටළු රාශියක් පිළිබඳව උපදෙස් ලබා ගත හැකිය. උපදේශනය නොමිලේ සිදු වේ.

## ● ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන

